කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2015

සැප්තැම්බර් - 2020

**BMGT E1035 - ව්‍යාපාර ආර්ථික විද්‍යාව**

වේලාව: පැය 03

උපදෙස්

i. මෙම ප්‍රශ්න පත්‍රය I කොටස, II කොටස සහ III කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

ii. ප්‍රශ්න සංඛ්‍යාව :

I කොටස - බහුවරණ ප්‍රශ්න 14 යි

II කොටස සහ III කොටස - ප්‍රශ්න 07

iii. I කොටසට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අදාල පිළිතුරු අනිවාර්යයෙන්ම ප්‍රශ්න පත්‍රයෙහිම සඳහන් කර එම කොටස ප්‍රශ්න පත්‍රයෙන් ඉවත්කොට එය පිළිතුරු පොතෙහි ඇමිණිය යුතුයි.

iv. II සහ III කොටසින් එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුය.

v. I කොටස විභාග ශාලාවෙන් පිටතට ගෙනයාමෙන් වලකින ලෙස ඔබට තරයේ අවවාද කරනු ලැබේ.

vi. ගණක යන්ත්‍ර භාවිතා කල හැකිය.

## 01 කොටස

1. පහත සඳහන් ප්‍රකාශ අතරින් කුමන ප්‍රකාශය සූක්ෂම ආර්ථික විද්‍යාවට අදාළ වන්නේද?

අ) මූර්ත දේශීය නිෂ්පාදනය පසුගිය වසරේදී 2.5% කින් ඉහළ ගියේය.

ආ) පසුගිය වසරේ සේවා වියුක්තිය ශ්‍රම බලකායෙන් 9.8% කි.

ඇ) සහල් මිල පසුගිය වසරේ පහත වැටුණි.

ඈ) සාමාන්‍ය මිල මට්ටම පසුගිය වසරේ 4% කින් ඉහළ ගියේය.

2. සාර්ව ආර්ථික විද්‍යාව සහ සූක්ෂම ආර්ථික විද්‍යාව අතර මූලික වෙනස වන්නේ,

අ) සූක්ෂම ආර්ථික විද්‍යාව තනි වෙළඳපල කෙරෙහි අවධානය යොමු කරන අතර සාර්ව ආර්ථික විද්‍යාව මූලික වශයෙන් ජාත්‍යන්තර වෙළඳාම කෙරෙහි අවධානය යොමු කරයි.

ආ) සූක්ෂම ආර්ථික විද්‍යාව තනි පාරිභෝගිකයින්ගේ හැසිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර සාර්ව ආර්ථික විද්‍යාව ආයතනවල හැසිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

ඇ) සූක්ෂම ආර්ථික විද්‍යාව තනි පාරිභෝගිකයින්ගේ සහ ආයතනවල හැසිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර සාර්ව ආර්ථික විද්‍යාව සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අවධානය යොමු කරයි.

ඈ) සූක්ෂම ආර්ථික විද්‍යාව උද්ධමනයට හේතු ගවේෂණය කරන අතර සාර්ව ආර්ථික විද්‍යාව විරැකියාවට හේතු කෙරෙහි අවධානය යොමු කරයි.

3. **කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අනම්‍ය නම්,**

අ) මිල අඩු වන විට නිෂ්පාදකයින් උපයන ආදායම වැඩිවේ.

ආ) මිල අඩු වන විට නිෂ්පාදකයින් උපයන ආදායම අඩු වේ.

ඇ) ඉහළ යන මිල ගණන් නිෂ්පාදකයින්ගේ ආදායමේ වෙනසකට තුඩු දෙන්නේ නැත.

ඈ) මිලෙහි ප්‍රතිශතක අඩුවීම ඉල්ලුමේ ප්‍රතිශතක වැඩිවීමට වඩා අඩුය.

4. **භාණ්ඩයක මිල 50% කින් වැඩිවන විට එම භාණ්ඩය සපයන ප්‍රමාණය ඒකක10 සිට 20 දක්වා වැඩි වේ නම්, සැපයුමේ මිල නම්‍යතාවයේ සංගුණකය ගණනය කරන්න.**

අ) ¼

ආ) ½

ඇ) 1

ඈ) 2

5. **ආන්තික උපයෝගීතාව නිර්වචනය කරන්නේ පහත සඳහන් ඒවායින් කවරක්ද?**

අ) මුළු උපයෝගිතවයේ වෙනස භාණ්ඩයේ මිලෙන් බෙදීම.

ආ) භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන උපරිම තෘප්තිය.

ඇ) පරිභෝජනය සඳහා ඇති භාණ්ඩයන් හැකි තරම් පරිභෝජනය කිරීමෙන් ලැබෙන මුළු තෘප්තිය.

ඈ) කිසියම් භාණ්ඩයක අතිරේක ඒකකයක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන අමතර තෘප්තිය.

6. උපේක්ෂා වක්‍රයකින් (Indifference curve) දැක්වෙනුයේ,

ආ) භාණ්ඩ දෙකක සමාන පරිභෝජනයයි.

ආ) භාණ්ඩ සංයෝජන දෙකක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන සමාන උපයෝගීතාවයි.

ඇ) සමාන පාරිභෝගික ආදායමක්.

ඈ) පරිභෝජනය කරන භාණ්ඩවල සමාන මිල ගණන්.

7. සමනිෂ්පාදන වක්‍රයේ (Isoquant) බෑවුම වන්නේ,

අ) ආන්තික නිෂ්පාදනය.

ආ) ආන්තික තාක්ෂණික ආදේශන අනුපාතය.

ඇ) සාමාන්‍ය නිෂ්පාදනය.

ඈ) මුළු නිෂ්පාදනය.

8. මුළු පිරිවැය ශ්‍රිතය $TC = 200 + 3Q + 2Q^2$ යැයි දී ඇති විට, නිෂ්පාදන මට්ටම $Q = 20$දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) ගණනය කරන්න.

අ) 1060

ආ) 200

ඇ) 20

ඈ) 10

9. ආයතනයක් සඳහා නිෂ්පාදනයේ කෙටිකාලීන සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉහළ යන්නේ නම්, මෙයින් ඇඟවෙන්නේ:

අ) සාමාන්‍ය මුළු පිරිවැය උපරිම වේ.

ආ) සාමාන්‍ය ස්ථාවර පිරිවැය නියත ය.

ඇ) ආන්තික පිරිවැය සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩිය.

ඈ) සාමාන්‍ය විචල්‍ය පිරිවැය සාමාන්‍ය ස්ථාවර පිරිවැයට වඩා අඩුය.

10. ඒකාධිකාරය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශවලින් සත්‍ය වන්නේ කුමක්ද?

අ) නිශ්චිත නිෂ්පාදිතයක් නිෂ්පාදනය කරන සමාගම් කිහිපයක් තිබේ.

ආ) එක් නිෂ්පාදන සමාගමක් පමණක් ඇත, නමුත් නිෂ්පාදිතයට සමීප ආදේශක ඇත.

ඇ) අදාළ වෙළඳපොළේ තරඟකරුවන් නොමැත.

ඈ) වෙළඳපලට ඇතුළුවීමට ඇති බාධක අඩුයි.

11. පහත ප්‍රකාශ අතරින් කුමන ප්‍රකාශය සත්‍ය ද?

අ) ජාතික වියදම = ජාතික ආදායම

ආ) ජාතික වියදම = ජාතික ආදායම + ජාතික ඉතිරිකිරීම්

ඇ) ජාතික වියදම = ජාතික ආදායම + බදු

ඈ) ජාතික වියදම = ජාතික ආදායම - බදු

12. **වෙළඳපල මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සමාන වන්නේ පහත දෑ අතරින් කුමකටද?**

අ) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය + ශු.විදේශ සාධක ආදායම්

ආ) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය - ශු.විදේශ සාධක ආදායම්

ඇ) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය - අපනයනය

ඈ) වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය + ආනයන

13. **රජයේ වියදම් අඩුවීම නිසා,**

අ) LM වක්‍රය ඉහළට විතැන් වේ.

ආ) IS වක්‍රය වමට විතැන් වේ.

ඇ) LM වක්‍රය පහලට විතැන් වේ.

ඈ) IS වක්‍රය දකුණට විතැන් වේ.

14. **ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනයට (Demand-pull inflation) හේතු විය හැක්කේ,**

අ) පිරිවැය වැඩිවීමයි.

ආ) පොලී අනුපාත අඩු වීමයි.

ඇ) රජයේ වියදම් අඩු කිරීමයි.

ඈ) සමාහාර සැපයුම අඩුවීමයි.

**(මුළු ලකුණු 14*2= 28)**

II සහ III කොටසෙන් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරා ගැනීමෙන් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න

II කොටස

ප්‍රශ්න අංක 01

"සූක්ෂම ආර්ථික විද්‍යාව මගින් සමාගම් ලාභය උපරිම කරන ආකාරයත් පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයින් සිය අතිරික්තය උපරිම කරන ආකාරයත් අධ්‍යනය කරන අතර, සාර්ව ආර්ථික විද්‍යාව තුලින් ජාතික ආදායම සහ වර්ධනය උපරිම කරන ආකාරය අධ්‍යනය කෙරේ ."

-ඇඩම් ස්මිත් ජාතීන්ගේ ධනය -

ඇ) ඉහත ප්‍රකාශයට අදාළව සමාගම් සඳහා උපරිම ලාභයද, පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයින් සඳහා උපරිම අතිරික්තය ද මගින් ජාතික ආදායම සහ වර්ධනය උපරිම කිරීම සිදු කරන්නේ කෙසේද යන්න කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

ආ) හිඟකම සංවර්ධනය වෙමින් පවතින හා සංවර්ධිත රටවලට පොදු ආර්ථික ගැටලුවකි. සංවර්ධිත රටවලටද හිඟකම ආර්ථික ගැටලුවක් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) තරඟකාරී වෙළඳපලක විකුණනු ලබන වෙළඳ භාණ්ඩයක් සඳහා වෙළඳපල ඉල්ලුම සහ වෙළඳපොල සැපයුම් ශ්‍රිතයන් වල ක්‍රියාකාරිත්වය පහත දැක්වේ.

**Qdx = 60 – 4p**

**Qsx = -20 +12p**

I. සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය තීරණය කරන්න.

(ලකුණු 04)

II. සැපයුම් ශ්‍රිතය නොවෙනස්ව පවතින අතර ඉල්ලුම් ශ්‍රිතය Qdx = 48-5P බවට වෙනස් වේ යැයි සිතන්න. නව සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය තීරණය කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 18)

ප්‍රශ්න අංක 02

ආ) තරගකාරී වෙළඳපොල ව්‍යුහයක් තුල සමාගමක් පහත සඳහන් ඉල්ලුම් ශ්‍රිතයන් සහ සම්පූර්ණ පිරිවැය ශ්‍රිතයන් සඳහා මුහුණ දෙයි.

$$P = 400 + 3Q$$

$$TC = 50 + 2Q^2$$

ලාභය උපරිම කරන මිල සහ නිමැවුම් මට්ටම තීරණය කරන්න.

**(ලකුණු 04)**

ආ) ශ්‍රී ලංකාවේ සුපිරි වෙළඳසැල් දාමය වඩාත් හොඳින් විස්තර කරන්නේ කුමන ආකාරයේ වෙළඳපල ව්‍යුහයක් තුලින්ද? හේතු සහිතව පිළිතුර සාධාරණීකරණය කරන්න.

**(ලකුණු 05)**

ඇ) ආන්තික ආදේශන අනුපාතිකය (MRS) ආන්තික තාක්ෂණික ආදේශන අනුපාතිකයෙන් (MRTS) වෙන්කර දක්වන්න.

**(ලකුණු 05)**

ඈ) "කාටලය"(Cartel) යනු කුමක්ද? කාටලගත වීමකදී ආයතන මුහුණපාන ගැටළු මොනවද?

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 18)**

**ප්‍රශ්න අංක 03**

අ. "පූර්ණ තරඟකාරී ආයතනයක් මිල ගනුවෙකු බව කියනු ලැබේ. මන්ද එය වෙළඳපල ලබා දෙන මිල ඒ ආකාරයට භාරගන්නා අතර මිල පාලනය කළ නොහැකි නිසාය". සුදුසු ප්‍රස්තාර භාවිතා කරමින් මෙම ප්‍රකාශය කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 06)**

ආ. "ඒකාධිකාරී සමාගම්වල මෙහෙයුම් කටයුතු ප්‍රායෝගිකව සියලු ධනවාදී රටවල විවේචනයට ලක්ව තිබේ". ඒකාධිකාරී සමාගමක ක්‍රියාකාරීත්වය මහජන සුභසාධනය අඩු කරයිද ? ඔබේ පිළිතුර සාධාරනීකරණය කරන්න.

**(ලකුණු 06)**

ඇ. සමාගමක් පහත සඳහන් ඉල්ලුම් හා ආන්තික පිරිවැය වක්‍රයන්ට මුහුණ දෙයි.

$$P = 400 - 8Q$$

$$MC = 8Q$$

ලාභය උපරිම කරන මිල සහ ප්‍රමාණය තීරණය කරන්න.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක 04

අ. "උපයෝගීතාව" යන සංකල්පය නිර්වචනය කර, පාරිභෝගික හැසිරීම විස්තර කිරීමේදී උපයෝගීතාවයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

**(ලකුණු 06)**

ආ. සැලසුම් හෙවත් ආවරණ වක්‍ර යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? මෙම වක්‍ර" U" හැඩයක් ගන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

ඇ. "පිරිවැය වක්‍ර යනු නිෂ්පාදන වක්‍රයන්හි කැඩපත් රූප වේ". ඉහත ප්‍රකාශයට ඔබ එකඟද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(ලකුණු 04)**

ඈ. උපේක්ෂා වක්‍ර ප්‍රවේශය භාවිතා කරමින් පාරිභෝගික සමතුලිතය පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 18)**

## III කොටස

**ප්‍රශ්න අංක 05**

අ. ජාතික අදායම ගණනය කිරීමේදී "එකතු කළ වටිනාකම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

**(ලකුණු 04)**

ආ. නාමික හා මූර්ත ජාතික ආදායම අතර වෙනස පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

ඇ. පහත සඳහන් දත්ත භාවිත කරමින් සමාගමක් විසින් වෙළඳපල මිලට එකතු කළ ශුද්ධ වටිනාකම ගණනය කරන්න.

| අයිතමය | ප්‍රමාණය |
|---|---|
| විකුණුම් | 400 |
| තොගයේ වෙනස්වීම | -20 |
| ක්ෂයවීම | 30 |
| ශුද්ධ වක්‍ර බදු | 40 |
| යන්ත්‍ර මිලදී ගැනීම | 200 |
| අතරමැදි නිෂ්පාදිත මිලදී ගැනීම | 250 |

**(ලකුණු 04)**

ඇ. පහත සඳහන් දත්ත වලින් දල ජාතික ආදායම ගණනය කරන්න.

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ශුද්ධ සංක්‍රාම | 10 |
| පෞද්ගලික අවසාන පරිභෝජන වියදම් | 600 |
| ජාතික ණය පොලී | 15 |
| ශුද්ධ අපනයන | -20 |
| රජයේ වත්මන් සංක්‍රාම | 5 |
| රජයට උපයා ගන්නා සාධක පිරිවැය යටතේ ශුද්ධ දේශීය නිෂ්පාදනය | 25 |
| රජයේ අවසාන පරිභෝජන වියදම | 100 |
| ශුද්ධ වක්‍ර බදු | 30 |
| ශුද්ධ දේශීය ප්‍රාග්ධනය සංචිතය | 70 |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | 10 |

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක 06

ඇ. "IS – LM ආකෘතිය මගින් වෙළඳපල දෙකක ඒකාබද්ධ සමතුලිතතාවය පරීක්ෂා කරන බව කියනු ලැබේ". ඔබ මෙම ප්‍රකාශයට එකඟද? සාධාරණීකරණය කරන්න.

**(ලකුණු 06)**

ආ . මුදල් ඉල්ලුමට අදාළ චේතනාවන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 03)**

ඇ. භාණ්ඩ වෙළඳපොලට අදාලව IS වක්‍රය ව්‍යුත්පන්න කරන්න.

**(ලකුණු 05)**

ඈ. ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය යනු කුමක්දැයි IS-LM ආකෘතිය භාවිතා කරමින් කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 18)**

ප්‍රශ්න අංක 07

අ. "තෙරපුම් ප්‍රතිවිපාකය" යනු කුමක්ද?

**(ලකුණු 05)**

ආ. "ශ්‍රී ලංකාවේ උග්‍ර සේවා වියුක්ති හිගයක් පවතිනුයේ උගත් තරුණයන් අතරය. ශ්‍රී ලංකාවේ වර්තමාන සේවා වියුක්ති ප්‍රවනතාවයන් ගෙන හැර දක්වමින් ඉහත ප්‍රකාශය විවරණය කරන්න.

**(ලකුණු 09)**

ඇ. පහත සඳහන් ක්‍රියාමාර්ග මගින් IS - LM සමතුලිතයට කුමක් සිදුවේද?

I. රජය විසින් රජයේ වියදම් අඩු කිරීම.

II. මුදල් සැපයුම අඩු කිරීමට මහ බැංකුව තීරණය කිරීම.

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 18)**